# ඔබගේ සේවායෝජකයා ඔබට හිරිහැර කරයිද?

## ඔබට....

විවේක දින ලබා ගැනීමට අවසර නැද්ද?
පවුලේ අය හෝ යහළුවන් හෝ සමග කතා කිරීමට අවසර නැද්ද?

## ඔබගේ සේවායෝජකයා....

ඔබගේ දුර ඇමතුම් වලට සවන් දෙනවාද?

ඔබට නිවසෙන් බැහැරව නිදහසේ යාමට ඉඩ දෙන්නේ නැද්ද? ඔබ අසනීප වූ අවස්ථාවන්හිදී ඔබට වෛද්‍යවරයෙකු හමු වීමට යාමට ඉඩ ලබා දෙන්නේ නැද්ද? වාචිකව  හෝ කායිකව ඔබට හිරිහැර කරනවාද? ඔබට තර්ජනය කරනවාද? ඔබගේ විදේශ ගමන් බලපත්‍රය ළඟ තබා ගෙන සිටිනවාද? ඔබව ලිංගිකව අපයෝජනයට  ලක් කරනවාද? ඔබගේ සේවයට නිසි වැටුප් ගෙවන්නේ නැද්ද?

ඔබට ලබා දී ඇති නවාතැන් පහසුකම් ප්‍රමාණවත් නැද්ද?

ඉහත සඳහන් ප්‍රශ්න අතුරින් එක් ප්‍රශ්නයකට හෝ කිහිපයකට මුහුණ පෑමට ඔබට හෝ ඔබ දන්නා කෙනෙකුට සිදු වී ඇත්නම්, උදව් ලබා ගැනීම සඳහා අප වෙත පැමිණෙන්න.

המוקד לפליטים ולמהגרים ע"ר

# පැමිණිලි කිරීමට බිය නොවන්න

**බොහෝ සේවක/ සේවිකාවන් තම සේවායෝජකයාට එරෙහිව පැමිණිලි කිරීමට බිය වන අතර, ඔවුන්ගේ ආරක්ෂාව සලසා ගැනීමට, නීති ආධාර ලබා ගැනීමට, නවාතැන් පහසුකම් ලබා ගැනීමට, පුනරුත්ථාපනය වීමට හා  රැකියා බලපත්‍ර ලබා ගැනීමට හිමිකමක් ඇති බව ද නොදනී.**

"එම්" නැමැති පිලිපීන ජාතික ගෘහ සේවිකාවකගේ කතාවක් උදාහරණයට ගනිමු. ඇයගේ සේවා කාලය පුරාම සතියේ දින හතේම, දවස පුරාම වැඩ කල අතර, කිසිදු විවේක දිනයක් ඇයට නොලැබිණි. තමා සේවය කල නිවසේ ඉඩ පහසුකම් ඇති කාමර කෙතරම් තිබුනත් ඇයට නිදා ගැනීමට සිදු වුනේ කුඩා නාන කාමරයක් තුල තිබූ කුඩා ඇඳකය. ඇයට නිවසින් බැහැරව ඉතා ළග තැනකට වුවද යාමට අවසර ලැබුනේ ඇයගේ රැකියාවට අදාළ කාර්යයන් සඳහා පමණි. අනෙකුත් ගමන් සඳහා හාම්පුතා විසින් සීමා පනවා තිබූ අතර, ඇයගේ විදේශ ගමන් බලපත්‍රයද හාම්පුතා භාරයේ රඳවා ගෙන තිබුණි.

ඇය පත්ව සිටින තත්වය දුටු අසල්වැසි නිවසක සේවකයෙකු, සහන නිලධාරියකුගේ දුරකථන අංකයක් සමග ජංගම දුරකතනයක් කැලිකසළ බඳුන අසල, ඇයට ගැනීමට හැකි වන පරිදි තබා තිබූ අතර, එමගින් ඇය උදව් ලබා ගෙන තමා පත්ව සිටි දුෂ්කර තත්වයෙන් නිදහස් වුවාය.

**සරණාගතයින් හා විදෙස් ශ්‍රමිකයින් සඳහා වන ක්ෂණික ඇමතුම් මගින් අපව අමතන්න**

**SOS@hotline.org.il / 050-8848250**